# ශ්‍රී ලංකා සෞඛ්‍යදාන ව්‍යාපාරය

## හැඳින්වීම ;

සෞඛ්‍යය යනු කායික හා මානසික නිරෝගීතාවයයි. දානය යනු, ජනතාව අතර බෙදාදීමයි. එබැවින් සෞඛ්‍යදානය යනු කායික හා මානසික නිරෝගීතාවය පොදු ජනතාව අතර බෙදාදීමයි.

## සෞඛ්‍යදාන ආදර්ශ පාඨය:

යෝ ගිලානං උපට්ඨෙයිය - සෝමං උපට්ඨෙයිය.

බුදුරජානන් වහන්සේ

(ගිලනුන්ට උපස්ථාන කිරීම, මට උපස්ථාන කළා හා සමානයි.)

බුදුරජානන් වහන්සේ

## සෞඛ්‍යදාන ලිපිනය:

අංක : 120, ඩබ්.ඒ.ඩී. රාමනායක මාවත, කොළඹ 2

දුරකථන අංකය 0112 434360

## සෞඛ්‍යදාන ලාංඡනය:

සෞඛ්‍යදාන ලාංඡනය අශෝක චක්‍රය වේ. මහා භාරතයේ රජකළ අශෝක අධිරාජයා හෙවත් ධර්මාශෝක රජු බුදු දහමට කැප වෙමින් ජනතාවගේ සෞඛ්‍ය සුරැකීමට රෝහල් තනා දෙමින් හා සත්වයන් වෙනුවෙන්ද, රෝහල් තනා දෙමින් කළ උතුම් සේවය ගෞරව පූර්වකව සිහිපත් කරමින් අශෝක චක්‍රය සෞඛ්‍යදාන ව්‍යාපාරයේ නිල ලාංඡනය ලෙස තෝරා ගෙන තිබේ.

මෙම අශෝක චක්‍රයේ කේන්ද්‍රයේ සිට පිටතට විහිදී ගිය සරළ රේඛා 24ක් තිබේ. මේ මගින් අප සම්මා සම්බුදු රජාණන් වහන්සේ දේශනා කළ චතුරාර්ය සත්‍ය, ආර්ය අෂ්ඨාංගික මාර්ගය පිළිඹිබු කෙරෙන අතර ඉවතට විහිදී යන ඉරි 24න් , යතු ධර්ම චක්‍රය පැහැදිලි කෙරේ. එබැවින් මෙම අශෝක චක්‍රයෙන් සියලුම සත්වයන් උදෙසා කරුණාව, මෛත්‍රිය පෙරදැරි කරගෙන කරනු ලබන සාත්තු සේවය පිළිබිඹු වේ.

අශෝක චක්‍රය දෙපස පිහිටි වී කරල් දෙකෙන් සශ්‍රීකභාවය, එකමුතු කම, සාමය, සමගිය, සංවර්ධනය හා සමෘද්ධිය පිළිබිඹු කෙරේ.

සෞඛ්‍යදාන ලාංඡනය හෙවත් අශෝක චක්‍රයේ පැහැය මෙරූන් රතු පැහැය (දුඹුරුවන් රතු) වේ.

## සෞඛ්‍යදාන ව්‍යාපාරයේ නිර්මාතෘතුමා

අප සෞඛ්‍යදාන ව්‍යාපාරයේ නිර්මාතෘතුමා වෛද්‍ය වජිරනාත් ලක්ෂ්මන් ද සිල්වා මහතාය. එතුමා 1960 වසරේදී මෙම උතුම් ව්‍යාපාරය ආරම්භ කර එහි පළමු මහා ලේකම්වරයා ලෙස ස්වේච්ඡාවෙන් සියළු සත්වයන් උදෙසා සේවය කරන සමාජ ප්‍රජා සත්කාරයට යොමු විය.

1929 ජුලි 18 දා, දකුණු පළාතේ දී උපන්, වජිරනාත් ලක්ෂ්මන් ද සිල්වා මහතා තරුණ වෛද්‍යවරයෙකු ලෙස සේවය කරන අවධියේදී සෞඛ්‍යදාන ව්‍යාපාරය ආරම්භ කරනු ලැබීය.

එතුමා කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයෙන් එම්.බී.බී.එස්. වෛද්‍ය උපාධිය ලබා, අති දුෂ්කර ප්‍රදේශ කිහිපයක සිය සීමා වාසික වෛද්‍ය සේවය අවසන් කොට, මහජන සෞඛ්‍ය වෛද්‍ය නිළධාරියෙකු ලෙස සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කොට්ඨාශ රැසක මහජනතාව වෙනුවෙන් සේවය කරණු ලැබීය. එතුමා ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් ඩී.පී.එම්. උපාධියද ලබාගෙන දිගු කාලයක් මහජනතාව වෙනුවෙන් සේවය කර විශ්‍රාම ගනු ලැබීය. ඉන්පසුව එතුමා සිය මුළු ජීවිතයම කැප කළේ ශ්‍රී ලංකා සෞඛ්‍යදාන ව්‍යාපාරය ගොඩ නංවමින් රට පුරා ජනතාවට ස්වේච්ඡාවෙන් සේවය සපුරාලීමටය.

## සෞඛ්‍යදාන ව්‍යාපාරයේ ඉතිහාසය - (1960 – 2025)

ශ්‍රී පාදය වන්දනා මාන කිරීමට 1959 මාර්තු මස මැදින් පොහෝ දින, එවකට තරුණ වෛද්‍යවරයෙකු වූ වෛද්‍ය වජිරනාත් ලක්ෂ්මන් ද සිල්වා මහතා ප්‍රමුඛ වෛද්‍ය සිසුන් හා හිතවතුන් පිරිසක් අති දුෂ්කර රත්නපුර මාර්ගය ඔස්සේ ශ්‍රී පාද කඳු තරණයේ යෙදුණි.

මෙහිදී බාල මහළු බොහෝ දෙනෙකු ගමන් අපහසුව නිසාත්, අධික සීතල නිසාත්, මාර්ගයේ දුෂ්කරතාව නිසාත්, කලට වේලාවට ආහාර නොලැබීයාම නිසාත්, විවිධ රෝගාබාධයනට ගොදුරු වූ, බැතිමතුන් අති විශාල සංඛ්‍යාවක් ශ්‍රී පාද තරණයේ යෙදුණු, වෛද්‍ය ලක්ෂ්මන් ද සිල්වා මහතාගේ නෙත ගැටුණි. ඔවුන්ගෙන් බොහෝමයක් උණ, වමනය, උදරාබාධ ආදියෙන් ද කුඩා දරුවන් බොහෝ දෙනෙකු වලිප්පුවෙන් ද, අධික ශීත නිසා ඇතිවන පපුවේ කැක්කුම් වලින් ද වෙහෙස මහන්සිය නිසා ඇතිවූ ශාරීරික වේදනා වලින්ද, සෙම්ප්‍රතිශ්‍යාව, උණ හා පාචනය වැනි තත්ව වලින් ද පෙළුණි.

එමෙන්ම වැඩිහිටියන් හා ළමුන් අති විශාල සංඛ්‍යාවක් ඉතාමත් අසරණව වැතිර සිටිනු මොවුන් දුටුහ. මෙසේ අසරණ වූ බැතිමතුන්ට නොමිළේ ස්වේච්ඡාවෙන් පිහිට වීමට එදා ශ්‍රී පාද වන්දනා කිරීමට ගිය වෛද්‍ය ලක්ෂ්මන් ද සිල්වා මහතා ප්‍රමුඛ පිරිස උත්සුක විය. ඔවුන්ගේ පෞද්ගලික පරිහරණයට රැගෙන ගිය ඖෂධ වලින් අසරණ රෝගීන්ට ප්‍රතිකාර කරණු ලැබීය.

ඉන්පසුව 1960 වසරේදී මාර්තු මස සෞඛ්‍යදාන ව්‍යාපාරය නමින් ස්වේච්ඡා සංවිධානයක් ආරම්භ කරමින් ශ්‍රී පාදයේදී, නල්ලතන්නිය, ගඟුලතැන්න, ඉදිකටුපහන, ආඬියාමලතැන්න හා මළුව යන ස්ථාන 5හේදී, ප්‍රථම සංවිධානාත්මක සෞඛ්‍යදාන කඳවුරු පවත්වනු ලැබීය. මේ මංගල කඳවුරට වෛද්‍යවරු, සහකාර වෛද්‍යවරු, හෙද හෙදියන් හා ව්‍යාපාරයේ පුහුණුව ලැබූ ස්වේච්ඡා සේවක සේවිකාවේ 100 ක්, පමණ සහභාගී වී අසරණ රෝගීනට කරුණාව, මෛත්‍රිය පෙරදැරි කොටගෙන පිහිටවිය.

එදා පටන් අද වන තුරුත්, ශ්‍රී පාදයේ වෛද්‍යාධාර කඳවුරු පවත්වමින් රෝගීන් දස දහස් ගණනනකට පිහිට වෙමින් ස්වේච්ඡා සේවයේ නිරත වීමට සෞඛ්‍යදානය අමතක කොට නැත.

එදා ඉතා සුළුවෙන් ආරම්භ කළ සෞඛ්‍යදාන ව්‍යාපාරය අද රට පුරා ගම් නියම් ගම් සිසාරා විහිදී පැතිරී ගිය දිස්ත්‍රික් සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන, පාසල් සෞඛ්‍යදාන ඒකක රාශියකින් සමන්විත දේශයේ ඉතාමත් ප්‍රබල ස්වේච්ඡා සේවා ව්‍යාපාරයකි.

එදා සිට මේ වනතෙක් කරුණාව, මෛත්‍රීය, මුදිතාව හා උපේක්ෂාව පෙරදැරි කරගෙන අවිහිංසාවාදීව, ප්‍රථමාධාර හා වෛද්‍යාධාර කටයුතු වල නියැලෙන සෞඛ්‍යදාන ව්‍යාපාරය අප රට නිජබිම කරගෙන ශ්‍රී පාද ස්ථානයේදී, සම්බුදු හිමි පාමුල ආරම්භ කළ ද, ජාති, ආගම්, කුල, පක්ෂ හා වර්ග භේද සියල්ලම දුරුකළ සැම ජාතිකයෙකුම, සැම ආගමිකයෙකුම සාමාජිකත්වය දරණ දීප ව්‍යාප්ත ව්‍යාපාරයක් වී තිබේ.

## <u>සෞඛ්‍යදාන ව්‍යාපාරයේ අරමුණු:</u>

1) මිනිස් ජීවිතයේදී කළ හැකි උසස්ම පරිත්‍යාග වන, සෞඛ්‍යය හෙවත් කායික මානසික නිරෝගීකම ප්‍රදානය හෙවත් දානය කිරීම මගින්, කඳුලින්, සුසුමින්, වේදනාවෙන්, ජීවත්වන ප්‍රජාව සුවපත් කිරීම.
2) සෞඛ්‍යදාන ස්වේච්ඡා සේවක සේවිකාවෝ ප්‍රතිලාභ අපේක්ෂාව මුළු මනින්ම බැහැර කරමින් සේවයෙන් ලැබෙන තෘප්තිය පමණක් උරුම කර ගැනීම..
3) ස්වේච්ඡා සේවයේ යෙදෙන විට තම කාලය හා ශ්‍රමයත්, තම ගතත්, සිතත් අන්‍යයන් උදෙසා කැප කිරීමේ පිළිවෙතට සමවදිමින් ඇප කැප වීම.
4) සේවයෙන් තෘප්තිමත් වන බැවින් ප්‍රතිලාභ ලැබීමේ චේතනාවෙන් මුළු මනින්ම බැහැර වීම නිසා කළකිරීමක් හෝ කණගාටුවක් කිසි ලෙසකින් වත් ඇති නොවීම.
5) ජාති, ආගම්, කුළ මල, භේද හා පක්ෂ භේද වලින් තොරව කටයුතු කිරීම මගින් සමස්ත පොදු ජනතාවටම සාධාරණය හා එක සමානව කටයුතු කිරීම.

## <u>සෞඛ්‍යදාන ව්‍යාපාරයේ දර්ශනය :</u>

සෞඛ්‍යදාන ව්‍යාපාරය සෞඛ්‍ය පහසුකම් ලබාදීමේ හා පතුරුවා හැරීමේ සංකල්පය මත ක්‍රියාත්මක වේ. විශේෂයෙන්ම ජනතාවගේ අවබෝධය හා සහභාගිත්වය දියුණු කිරීමෙන් ඔවුන්ගේ සෞඛ්‍ය තත්වය නංවාලීම සෞඛ්‍යදානයෙන් ඉටුවේ. මෙම සේවය ඉටු කිරීමෙහිලා කැපවුණු සංහතියක් හා ඒ තුළින් රට ජාතිය කෙරෙහි, ඇල්ම ඇති තරුණ සමූහයක් සංවිධානය කළහැකි බව, අපේ විශ්වාසයයි. සමාජයේ පවතින ආත්මාර්ථකාමී, අර්ථ ශූන්‍ය සිතුවිලි සමුදායන් හා පිරිහෙමින් පවතින සමාජය වෙනස් කිරීමේ කාර්ය අප ව්‍යාපාරයේ දර්ශනය තුළින් ක්‍රියාත්මක කෙරේ. මේ අනුව ක්‍රියාකාරිත්වය හා අරමුණු අතින් අප ව්‍යාපාරය බහු අභිප්‍රායික වේ. සෞඛ්‍යදානය සුභසාධක මෙහෙවරක නියැලෙන සංවිධානයක් වන අතර ඒ වෙනුවෙන් කැප වූ පුද්ගලයින් තුළ චින්තන පරිවර්ථනයක් ඇති කරමින් දේශය පිළිබඳව අභිමානයක් අභිප්‍රේරණය කෙරේ.

සෞඛ්‍යදානය ගඟක් හරවා එලූ මා දැළක් වැනිය. එහි වතුර හෙවත් ස්වේච්ඡා සේවක සේවිකාවෝ මා දැළ වෙත එති. ඒ තුළින් ගලා ගොස් පිරිසිදු වෙති. එහි දර්ශනයේ හා ක්‍රියාවලියේ බලපෑමෙන් පිරිසිදුවී, සංවිධානයේ මාර්ගය සහ අතු මාර්ග ඔස්සේ ගොස් කා හට හෝ පිහිට වෙති. එම නිසා සෞඛ්‍යදානයට සංගමය යැයි නොකියා ව්‍යාපාරය යැයි කියනු ලබති. එබැවින් එය මහා නගර වල සිට කුඩා නගර වලටත්, එහි සිට ගම්මාන වලටත්, නිවාස වලටත් පැතිරී යති. එමගින් ජන සමාජය ආලෝකමත් කරති. සෞඛ්‍යදානයේ දර්ශනය එයයි.

## සෞඛ්‍යදාන ව්‍යාපාරයේ සේවා:

1. සෞඛ්‍ය සම්පත සුරැකීම සඳහා රෝග නිවාරණයට, සෞඛ්‍ය අධ්‍යාපනයට, ප්‍රජා සංවර්ධනයට හා ස්වයංපෝෂණයට දිරිදීම සඳහා ව්‍යාපෘති සංවිධානය.
2. ශ්‍රී පාදය, අනුරාධපුර, කතරගම වැනි පූජා භූමි වන්දනා සමයේ එක් රැස් වන බැතිමතුන්ට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී නොමිලේ ප්‍රථමාධාර හා වෛද්‍යාධාර සැපයීම.
3. වෙනත් ආගමික හා ජාතික උත්සව අවස්ථාවලදී එක් රැස් වන ජනතාවට ප්‍රථමාධාර හා වෛද්‍යාධාර ලබාදීම.
4. පාසල් සිසු සිසුවියන්ට, පාසල් හැරගිය තරුණ තරුණියන්ට සෞඛ්‍යදාන පාසැල් ඒකක හා ප්‍රා දේශීය ඒකක මගින් ප්‍රථමාධාර, සෞඛ්‍යය, ගෘහ හෙදකම, පෝෂණය, ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණය, හා බොවෙන රෝග වළක්වා ගැනීම ගැන නොමිලේ සෞඛ්‍යදාන පුහුණුවක් ලබාදී ඔවුන්ට කණිෂ්ඨ සහතික පිරිනැමීම.
5. අධ්‍යාපන අමාත්‍යාංශය සමග එකතුව පාසල් සෞඛ්‍යදාන ඒකක විධිමත්ව පවත්වාගෙන යමින් සිසු දරු දැරියනට සෞඛ්‍යදාන පුහුණුවක් ලබාදීම හා කණිෂ්ඨ සහතික පත්‍ර ලබාදීම.
6. පාසල් ගුරු මහත්ම මහත්මීන්ට සෞඛ්‍යදාන ගුරු පුහුණුව ලබාදීම.
7. ජාතික ව්‍යසන හා ආපදා අවස්ථාවන්හිදී ව්‍යසනයට ලක්වන ජනතාවට සෞඛ්‍යදාන ප්‍රථමාධාර හා වෛද්‍යාධාර ලබාදීම හා සහන ලබාදීම.
8. පිළිකා රෝගය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම, හඳුනාගැනීම, උපදේශනය හා අධ්‍යාපනය ලබාදීම මෙන්ම රෝගීනට සහනය සැළසීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.
9. මනෝ විද්‍යා උපදේශනය මගින් සමාජයේ විවිධ ක්ෂේත්‍ර වල ජනතාවට සහනයක් සැළසීම.

## සෞඛ්‍යදාන ගීතය

සේවකයින් ස්වේච්ඡා - අප සැම සෞඛ්‍යදානයේ...
සමගිව සතුටින අසරණයින් වෙත යොදවමු ශ්‍රමය අපේ//

ගිලනුන් හට අප සැමා - මෙත් කරුණා වඩවා
සුවසෙත යහපත් සලසන්ටා යමු යමු ඉදිරියටා

සේවකයින් ස්වේච්ඡා - අප සැම සෞඛ්‍යදානයේ ..
සමගිව සතුටින අසරණයින් වෙත යොදවමු ශ්‍රමය අපේ//
සේවකයිනි අප සැමා - පසුබට නොවි කිසිදා ..
දිරිදෙමු ව්‍යාපාරය අප ගේ දියුණුව සළසන්ටා ..//

සේවකයින් ස්වේච්ඡා - අප සැම සෞඛ්‍යදානයේ ..
සමගිව සතුටින අසරණයින් වෙත යොදවමු ශ්‍රමය අපේ ..//

**<u>සෞඛ්‍යදාන ප්‍රතිඥාව</u>**

සෞඛ්‍යදාන ව්‍යාපාරයේ නාමයෙන් හා මනුෂ්‍ය සංහතිය වෙනුවෙන් සේවයට කැපවීමට මම දිවුරා පොරොන්දු වෙමි. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාව නංවාලීමටද, අසරණ රෝගීනට සේවය කිරීමට ද, කැමැත්තෙන්ම සේවයට හා උදව් වීමට ඉදිරිපත් වීමට, දිවි හිමියෙන් බැඳී සිටිමි.

ආගම්, කුල, ජාති, දේශපාලන භේදයෙන් තොරව සේවය කිරීමට මම පොරොන්දු වෙමි. සේවයෙන් ලැබෙන සතුටින්ම සෑහීමකට පත් වන මා කිසියම් පෞද්ගලික ලාභ ප්‍රයෝජනයක් හෝ ආත්මාර්ථකාමී පරමාර්ථයන් ඉටු කර ගැනීමට ව්‍යාපාරයේ නාමයෙන් කිසිසේත් බලාපොරොත්තු නොවෙමි.

අවශ්‍ය සෑම අවස්ථාවකදීම සේවයට ඉදිරිපත් වීමට මා සූදානම් ව සිටින අතර, මාගේ දැනුම වැඩි දියුණු කර ගැනීමට, සේවා මට්ටම නංවාලීමට, අධ්‍යාපන වැඩ කටයුතු වල නොකඩවා යෙදීමට පොරොන්දු වෙමි.

සෞඛ්‍යදාන නවකයින් යහමග යැවීමට හා ඔවුන් හට ක්‍රමවත් පුහුණුවක් ලබාදීමට මම බැඳී සිටිමි. විනය ගරුක, යුක්තිගරුක, ආචාරශීලී, පරහිතකාමී සේවක සේවිකාවන් වී. ජාතිකාභිමානයෙන් හා දේශප්‍රේමීත්වයෙන් යුතුව සේවය කිරීමට මම දිවුරා පොරොන්දු වෙමි.

සකස් කිරීම -

දයා ශ්‍රී නරේන්ද්‍ර රාජපක්ෂ
පාලක මණ්ඩල සාමාජික
ශ්‍රී ලංකා සෞඛ්‍යදාන ව්‍යාපාරය
නො. 120, ඩබ්.ඒ.ඩී. රාමනායක මාවත,
කොළඹ 02.
දු.ක./ ෆැක්ස් : 011 2434360
ඊ මේල් : srilankasaukyadana@gmail.com
වෙබ් : www.saukyadana.org
face book : Sri Lanka Saukyadana Movement (SLSM)

2025 මාර්තු මස